DURDANS HOSPITAL

**පෞද්ගලික දත්ත ආරක්ෂණ නිවේදනය**

## 1. හැඳින්වීම

1. මෙම පෞද්ගලික දත්ත ආරක්ෂණ නිවේදනය ("නිවේදනය") හෝ රහස්‍යතා නිවේදනය 2025 සැප්තැම්බර් 22 වන දින ("බලපැවැත්වෙන දිනය") ප්‍රකාශයට පත් කරන ලදී.
2. ඩර්ඩන්ස් රෝහල සහ පරීක්ෂණාගාර (Durdans Hospital & Laboratories) වෙතින් සමන්විත ඩර්ඩන්ස් සමූහය ("අපි", "අපගේ" හෝ "අප"), එනම් අංක 03, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටි සිලෝන් හොස්පිට්ල්ස් පී.එල්. සි (CEYLON HOSPITALS PLC) සහ/හෝ ඩර්ඩන්ස් මෙඩිකල් ඇන්ඩ් සර්ජිකල් හොස්පිට්ල් (පුද්ගලික) සමාගම (DURDANS MEDICAL & SURGICAL HOSPITAL (PVT) LTD) සහ එහි අනුබද්ධ සමාගම්, පුද්ගලයන්ගේ ("ඔබේ", "ඔබ" හෝ "ඔබගේ") පෞද්ගලික දත්ත වගකීම් සහගතව සහ අදාළ දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූලව ආරක්ෂා කිරීමට බැඳී සිටී. ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවලදී, 2022 අංක 09 දරන ශ්‍රී ලංකා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ("PDPA") පමණක් අදාළ විය යුතුය.
3. මෙම නිවේදනය අප විසින් ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් අදාළ වේ. ඔබ අප සමඟ ගනුදෙනු කරන විට අප විසින් ඔබගේ පෞද්ගලික දත්ත සකසනු ලබන ආකාරය මෙහි පැහැදිලි කෙරේ. ඔබ අපගේ රෝගියෙකු, සේවකයෙකු, කොන්ත්‍රාත්කරුවෙකු හෝ ව්‍යාපාරික හවුල්කරුවෙකු විය හැකිය.
4. පනතේ (PDPA) සංශෝධනවලට අනුකූලව හෝ ඔබට අමතර තොරතුරු ලබා දීම සඳහා මෙම නිවේදනය කලින් කලට යාවත්කාලීන කරනු ලැබිය හැකිය. මෙම නිවේදනය සැලකිලිමත්ව කියවන ලෙස අපි ඔබව උනන්දු කර සිටිමු.

## 2. පෞද්ගලික දත්ත

1. මෙම නිවේදනයේ කාර්යය සඳහා, "පෞද්ගලික දත්ත" යන්නෙන් අදහස් කරනුයේ, (අ) යම් නාමයක්, හඳුනාගැනීමේ අංකයක්, මූල්‍ය දත්තයක්, ස්ථානීය දත්තයක්, හෝ යම් මාර්ගගත හඳුන්වනයක් වැනි යම් හඳුන්වනයක්; හෝ (ආ) එම පුද්ගලයාගේ හෝ ස්වභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක, කායික, ජානමය, මානසික, ආර්ථික, සංස්කෘතික හෝ සමාජයීය අනන්‍යතාවයට විශේෂිත වූ සාධක එකක් හෝ වැඩි ප්‍රමාණයක්, ආශ්‍රයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් යම් දත්ත දායකයකු හඳුනාගත හැකි යම් තොරතුරක් අදහස් වේ.
2. ඔබ අප සමඟ පවත්වනු ලබන ගනුදෙනුවේ ස්වභාවය අනුව, අප විසින් රැස් කරනු ලබන පෞද්ගලික දත්තවලට ඔබගේ පුද්ගලික හඳුනාගැනීමේ තොරතුරු, සෞඛ්‍ය සහ වෛද්‍ය තොරතුරු, ගිණුම් සහ චරිත තොරතුරු, ජාල ගමනාගමනය (network traffic) සහ ඒ ආශ්‍රිත දත්ත සහ/හෝ ඔබ අප සමඟ ගනුදෙනු කිරීමේදී අප වෙත ලබා දී ඇති හෝ අපට ප්‍රවේශ විය හැකි වෙනත් ඕනෑම තොරතුරක් ඇතුළත් විය හැකිය.
3. රැස් කරනු ලැබිය හැකි පෞද්ගලික දත්ත පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර 1 වන පරිශිෂ්ඨය (Appendix 1) බලන්න.
4. අවදානමට ලක්විය හැකි තැනැත්තන්ගේ පෞද්ගලික දත්ත:

1) අවදානමට ලක්විය හැකි තැනැත්තන්ගේ පෞද්ගලික දත්ත රැස් කිරීමට, භාවිතා කිරීමට හෝ හෙළිදරව් කිරීමට ප්‍රථමයෙන් මවුපියන්ගේ, භාරකරුගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයාගේ අවසරය ලබා ගැනීම නීතියෙන් අවශ්‍ය වන අවස්ථාවලදී, එම නීතියට අනුකූල වීම අපගේ අභිප්‍රාය සහ ප්‍රතිපත්තිය වේ.
2) අවුරුදු 16 ට අඩු ළමයෙකු හෝ භාරකාරත්වය යටතේ සිටින තැනැත්තෙකු, අදාළ මවුපියන්ගේ, භාරකරුගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයාගේ කැමැත්ත නොමැතිව පෞද්ගලික දත්ත ලබා දී ඇති බවට මවුපියන්, භාරකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා දැනුවත් වන්නේ නම්, කරුණාකර අපව සම්බන්ධ කරගන්න (සම්බන්ධ කරගත හැකි විස්තර පහත දැක්වේ). එවැනි පෞද්ගලික දත්ත අපගේ වාර්තාවලින් නිවැරදිකිරීම කිරීම හෝ ඉවත් කර දැමීම සිදු කරනු ඇත.

## 3. අප පෞද්ගලික දත්ත රැස් කරන්නේ කෙසේද?

ඔබ අප සමඟ පවත්වනු ලබන ගනුදෙනු අතරතුරදී, ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා හෝ ඔබ සමඟ ගිවිසුමකට එළඹීමට හෝ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී අප විසින් ඔබ පිළිබඳ පෞද්ගලික දත්ත ලබා ගනු ලැබිය හැකිය. එවැනි අවස්ථාවකදී, ඔබගේ පෞද්ගලික දත්ත ලබා දීමට ඔබ බැඳී සිටී. ඔබ ඔබගේ පෞද්ගලික දත්ත අප වෙත ලබා නොදෙන්නේ නම්, මෙම නිවේදනයේ දක්වා ඇති සමහර අරමුණු ඉටු කර ගැනීමට අපට නොහැකි වනු ඇත.

අනෙකුත් අවස්ථාවලදී, අප වෙත පෞද්ගලික දත්ත ලබා දීමේ තීරණය අනිවාර්ය නොවේ.

අපි පහත සඳහන් ක්‍රම මඟින් ඔබෙන් පෞද්ගලික දත්ත රැස් කරනු ලබන්නෙමු,

1. සෘජුවම:

1. ඔබ රෝහලට ඇතුළත් වන විට, වෛද්‍ය හමුවීමක් වෙන් කරන විට, වෛද්‍ය පරීක්ෂණයකට හෝ සුවතා පරීක්ෂණයකට/තක්සේරුවකට භාජනය වන විට, ගිණුමක් ආරම්භ කරන විට, අපගේ ඖෂධ සැලෙන් ඖෂධ මිලදී ගන්නා විට, වෛද්‍ය විද්‍යාගාර පරීක්ෂණයක් සිදු කරන විට, එක්දින සත්කාර (ambulatory care) ලබන විට, අප සමඟ ලියාපදිංචි වන විට සහ/හෝ අප වෙත යම් ආකෘති පත්‍රයක් ඉදිරිපත් කරන විට හෝ අපගේ සේවාවන්හි ප්‍රතිලාභ ලබන විට;
2. අපගේ කණ්ඩායම් සමඟ මුහුණට මුහුණ හමුවීම්වලදී, දුරකථන සංවාදවලදී, විද්‍යුත් තැපෑල මඟින් සහ/හෝ ඕනෑම ලියාපදිංචි කිරීමේ, සන්නිවේදන හෝ පණිවිඩ හුවමාරු වේදිකාවන් හරහා ඔබ පෞද්ගලික දත්ත හෙළිදරව් කරන විට;
3. අපගේ අලෙවිකරණ සහ ප්‍රවර්ධන සන්නිවේදන කටයුතු සහ/හෝ වෙනත් ඕනෑම වැඩසටහන් සඳහා ඔබ ලියාපදිංචි වන විට;
4. අපගේ වෙබ් අඩවි, ජංගම යෙදුම් හෝ සමාජ මාධ්‍ය වේදිකාවල ඔබ අප සමඟ ගනුදෙනු කරන විට, සන්නිවේදනය කරන විට සහ/හෝ අදහස් (comments) පළ කරන විට;

5. ඔබ අප සමඟ ඇති කරගන්නා ගනුදෙනු, සම්බන්ධතා සහ/හෝ සබඳතාවලට අදාළව කිසියම් ගිවිසුමකට, හවුල්කාරිත්වයකට, සහයෝගීතාවයකට එළඹෙන විට සහ/හෝ වෙනත් ලේඛන හෝ තොරතුරු සපයන විට;
6. ඔබ අපගේ පරිශ්‍රයට පැමිණෙන විට සහ/හෝ එහි රැඳී සිටින විට, CCTV කැමරා මඟින් ඔබගේ රූප සටහන් ලබා ගන්නා අවස්ථාවලදී හෝ ඔබ අපගේ යම් උත්සවයකට සහභාගී වන විට අප හෝ අපගේ නියෝජිතයන්, නියුක්තිකයන්, සේවා සපයන්නන් හෝ අනුබද්ධිත ආයතන විසින් ලබා ගන්නා ඡායාරූප හෝ වීඩියෝ දර්ශන මඟින්;
7. රැකියා, ආධුනිකත්ව (internship), අනුයුක්ත කිරීම් (attachment), අධ්‍යාපන හෝ සහතික කිරීම (accreditation) සඳහා ඔබ අයදුම්පත් ඉදිරිපත් කරන විට;
8. වෙනත් යම් හේතුවක් මත ඔබගේ පෞද්ගලික දත්ත අප වෙත ලබා දෙන විට;

2. වක්‍රව:

1. වෙනත් දත්ත මූලාශ්‍රවලින් ඔබ අප සමඟ පවත්වනු ලබන ගනුදෙනු, සම්බන්ධතා සහ/හෝ සබඳතාවලට අදාළව (අපගේ නිෂ්පාදන සහ සේවාවන් සඳහා හෝ රැකියා, අධ්‍යාපන සහ ප්‍රතීතන අයදුම්පත් ඇතුළුව, නමුත් ඒවාට පමණක් සීමා නොවී) ඔබගේ පෞද්ගලික දත්ත අප විසින් සොයා බලන සහ ලබා ගන්නා අවස්ථාවලදී;
2. අපට වෙනත් වෛද්‍ය සේවා සපයන්නන්ගෙන් ඔබගේ පෞද්ගලික දත්ත අප වෙත ලැබෙන විට (සම්බන්ධිත හෝ තෙවන පාර්ශවීය);
3. ඔබට යම් ප්‍රතිලාභයක් ලබා දීමට අපේක්ෂා කරන තෙවන පාර්ශවයන්ගෙන් (උදාහරණයක් ලෙස: ඔබගේ සේවායෝජකයා, ඔබගේ නියෝජිතයා හෝ රක්ෂණකරු) ඔබගේ පෞද්ගලික දත්ත අප වෙත ලැබෙන විට;
4. ඔබ අතරමැදියෙකු ලෙස ක්‍රියා කරන්නේ නම් හෝ තෙවන පාර්ශවයකට/වෙනත් පුද්ගලයෙකුට (උදාහරණයක් ලෙස: ඥාතියෙකු, මිතුරෙකු, සගයෙකු, රෝගියෙකු, සේවකයෙකු යනාදී වශයෙන්) අදාළ පෞද්ගලික දත්ත සහ තොරතුරු අප වෙත සපයන්නේ නම්, එම තෙවන පාර්ශවයේ/වෙනත් පුද්ගලයාගේ පෞද්ගලික දත්ත අප විසින් සැකසීම සඳහා අවශ්‍ය කැමැත්ත එම අදාළ තෙවන පාර්ශවයෙන් /වෙනත් පුද්ගලයාගෙන් ලබාගෙන ඇති බවට ඔබ සහතික විය යුතුය;
5. අප ඔබෙන් තෙවන පාර්ශවයකගේ හෝ වෙනත් පුද්ගලයෙකුගේ පෞද්ගලික දත්ත රැස් කරන බැවින්, එම තෙවන පාර්ශවය හෝ වෙනත් පුද්ගලයා අපගේ වෙබ් අඩවිය වෙත යොමු කිරීමෙන් හෝ මෙම නිවේදනයේ අන්තර්ගතය පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමෙන්, මෙහි සඳහන් සියලු කරුණු පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට ඔබ සහතික විය යුතුය; සහ/හෝ
6. අනෙකුත් මූලාශ්‍රවලින් අප විසින් රැස් කරනු ලැබිය හැකි වෙනත් ඕනෑම තොරතුරක්.

## 4. පෞද්ගලික දත්තවල නිරවද්‍යතාව සහතික කිරීම

1. අපි පෞද්ගලික දත්ත නිරවද්‍ය, සම්පූර්ණ සහ යාවත්කාලීන මට්ටමකින් පවත්වාගෙන යාමට උත්සාහ කරන්නෙමු. ඔබ අප වෙත ලබා දෙන පෞද්ගලික දත්ත නිරවද්‍ය, සම්පූර්ණ සහ යාවත්කාලීන විය යුතු අතර, ඔබ ලබා දුන් එම පෞද්ගලික දත්තවල යම් සැලකිය යුතු වෙනසක් සිදුවුවහොත් ඒ පිළිබඳව ඔබ අපට දැනුවත් කළ යුතුය.
2. තවද, ඔබ අතරමැදියෙකු ලෙස ක්‍රියා කරන්නේ නම් හෝ තෙවන පාර්ශවයකට/වෙනත් පුද්ගලයෙකුට අදාළ පෞද්ගලික දත්ත සහ තොරතුරු අප වෙත සපයන්නේ නම්, එම පෞද්ගලික දත්ත රැස් කිරීම පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට (PDPA) අනුකූලව සිදු කර ඇති බව සහතික කිරීමට ඔබ වගබලා ගත යුතුය. උදාහරණයක් ලෙස, මෙම නිවේදනයේ අන්තර්ගතය පිළිබඳව ඔබ එම තෙවන පාර්ශවය/වෙනත් පුද්ගලයා දැනුවත් කළ යුතුය.

## 5. පෞද්ගලික දත්ත රැස් කරනු ලබන්නේ, භාවිතා කරනු ලබන්නේ, හෙළිදරව් කරනු ලබන්නේ හෝ සකසනු ලබන්නේ කුමන අරමුණක් සඳහාද?

පෞද්ගලික දත්ත පහත සඳහන් අරමුණු එකක් හෝ කිහිපයක් සඳහා රැස් කරනු ලැබිය හැකිය, භාවිතා කරනු ලැබිය හැකිය, හුවමාරු කරනු ලැබිය හැකිය හෝ වෙනත් ආකාරයකින් සකසනු ලැබිය හැකිය:

1. <u>වෛද්‍ය සේවා සැපයීමේ අරමුණු:</u> ඔබට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා අවශ්‍ය වන සැකසීම් සහ ඒ හා සාධාරණ ලෙස සම්බන්ධ අනෙකුත් අරමුණු සඳහා.
2. <u>ජීවිතාරක්ෂක අවශ්‍යතා (Vital interests):</u> ඔබගේ ජීවිතාරක්ෂක අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන සැකසීම් සඳහා, උදාහරණයක් ලෙස, ඔබගේ ජීවිතය හෝ ඔබව හානියකින් ආරක්ෂා කර ගැනීමට අපට අවශ්‍ය වන අවස්ථාවන්හිදී.
3. <u>ව්‍යාපාරික අරමුණු:</u> මේවා අපගේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට උචිත නීත්‍යානුකූල අවශ්‍යතා (legitimate purposes) වේ. ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම, ඉන්වොයිසි නිකුත් කිරීම, බිල්පත් සකස් කිරීම සහ පුද්ගලයන්ගේ ගිණුම් කළමනාකරණය, පාරිභෝගික සේවය සහ සහය ලබා දීම, මුදල් සහ ගිණුම්කරණය, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, අභ්‍යන්තර කළමනාකරණය සහ පාලනය සහ ඒ හා සාධාරණ ලෙස සම්බන්ධ වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක් සඳහා අවශ්‍ය වන සැකසීම් මෙයට ඇතුළත් වේ.
4. <u>මානව සම්පත් කළමනාකරණය:</u> සේවකයෙකු සමඟ ඇති රැකියා හෝ වෙනත් ගිවිසුමක් ඉටු කිරීමට අවශ්‍ය වන (හෝ ගිවිසුමකට එළඹීමට පෙර සේවකයෙකුගේ ඉල්ලීම පරිදි අවශ්‍ය පියවර ගැනීම සඳහා) හෝ රැකියා සම්බන්ධතාවය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සැකසීම් මෙයට ඇතුළත් වේ.
5. <u>සෞඛ්‍යය, සුරක්ෂිතතාව සහ ආරක්ෂාව:</u> වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම, අපගේ වත්කම් ආරක්ෂා කිරීම, ඔබව තහවුරු කර ගැනීම (verification) සහ ඔබගේ ප්‍රවේශ අයිතිවාසිකම් සහ එහි තත්ත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන සැකසීම් සඳහා;

6. <u>නීත්‍යානුකූල සහ නියාමන බැඳීම්වලට අනුකූල වීම:</u> අප යටත් වන්නා වූ නීත්‍යානුකූල හෝ නියාමන බැඳීමකට අනුකූල වීම සඳහා අවශ්‍ය වන සැකසීම් සඳහා.
7. <u>අලෙවිකරණය සහ ප්‍රවර්ධනය:</u> අලෙවිකරණ සන්නිවේදන සහ/හෝ ප්‍රවර්ධන කටයුතු සඳහා පෞද්ගලික දත්ත සකසන විට අප විසින්: 1. ඔබගේ කැමැත්ත ලබා ගැනීම; සහ/හෝ 2. එම සැකසීමේ කටයුතු සමඟ ඉදිරියට නොයාමට සහ/හෝ එවැනි සන්නිවේදනයන් ලබා නොගැනීමට තෝරා ගැනීමට ඔබට අවස්ථාව ලබා දීම සිදු කරනු ඇත. එවැනි දෑ ලබා ගැනීමට ලබා දුන් කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට ඔබ කැමති නම්, කරුණාකර අපව සම්බන්ධ කරගන්න (සම්බන්ධ කරගත හැකි විස්තර පහත දැක්වේ).
8. <u>ද්විතීයික අරමුණු:</u> පෞද්ගලික දත්ත (පෙර රැස් කරන ලද දත්ත ඇතුළුව) පහත දැක්වෙන ද්විතීයික අරමුණු සඳහා සැකසීම:
 1. ඉල්ලීමක් ලැබුණහොත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ මහජන සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පෞද්ගලික දත්ත ලේඛනාගාරයක් වෙත යොමු කිරීම;
 2. අභ්‍යන්තර විගණන හෝ පරීක්ෂණ පැවැත්වීම;
 3. ව්‍යාපාරික පාලනයන් ක්‍රියාත්මක කිරීම;
 4. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් සඳහා අවශ්‍ය පරිදි සංඛ්‍යානමය, ඓතිහාසික හෝ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම;
 5. ආරවුල් විසඳීම සඳහා සූදානම් වීම හෝ මැදිහත් වීම;
 6. නීතිමය හෝ ව්‍යාපාරික උපදේශන සේවා ලබා ගැනීම;
 7. රක්ෂණ හෝ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධ ගැටළු කළමනාකරණය කිරීම; සහ/හෝ
 8. හඳුනාගත හැකි සංරචක ඉවත් කිරීම, අපැහැදිලි කිරීම (obfuscation), ව්‍යාජ නාමකරණ ලබා දීම (pseudonymisation), හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කිරීම (anonymisation) හෝ වෙනත් ඕනෑම ක්‍රමයක් හරහා ඔබව හඳුනාගත නොහැකි වන පරිදි පෞද්ගලික දත්ත ඇසුරින් හඳුනාගත නොහැකි කළ (de-identified), සමුච්චිත (aggregated) සහ/හෝ හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කළ (anonymised) දත්ත නිර්මාණය කිරීම. මෙය මෙය පහත සඳහන් අරමුණු ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී සිදු කරනු ලබයි (අ) ආරක්ෂාව වැඩිකිරීම; සහ/හෝ (ආ) රෝගී සත්කාර ප්‍රශස්ත කිරීම සහ සෞඛ්‍ය සේවා, නිෂ්පාදන සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා වැඩිදුර සැකසීම, සමුච්චය කිරීම, විශ්ලේෂණය කිරීම (ඔබගේ පෞද්ගලික දත්ත තවදුරටත් අඩංගු නොවන නිර්නාමික දත්ත පමණක්) සඳහා වන අතර, එම අරමුණු සඳහා එවැනි හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කළ දත්ත අපගේ අනුබද්ධිත ආයතන සහ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත යොමු කිරීම ද මෙයට ඇතුළත් විය හැකිය
 9. වෙනත් ඕනෑම සාධාරණ ලෙස සම්බන්ධ අරමුණු.
 10. පෞද්ගලික දත්ත සකසනු ලබන අරමුණු පිළිබඳ වැඩිදුර විස්තර සඳහා, කරුණාකර 2 වන පරිශිෂ්ඨය (Appendix 2) බලන්න.

11. <u>ව්‍යතිරේඛ</u>: මෙම නිවේදනය යටතේ ඇති අපගේ ඇතැම් බැඳීම් අභිබවා යා හැකිය, එනම් අදාළ නිශ්චිත තත්ත්වයන් යටතේ ඔබගේ අවශ්‍යතාවයට වඩා ඉහළින් පවතින අත්‍යවශ්‍ය නීත්‍යානුකූල අවශ්‍යතාවයක් පවතී නම් පමණි. එවැනි තත්ත්වයක් පවතින්නේ පහත සඳහන් අවශ්‍යතාවයක් ඇති විටය:

1) අපගේ ව්‍යාපාරික අවශ්‍යතා ආරක්ෂා කිරීම, එනම්:
   1. පුද්ගලයන්ගේ සෞඛ්‍යය, සුරක්ෂිතතාව හෝ ආරක්ෂාව;
   2. අපගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, වෙළඳ රහස් හෝ කීර්තිනාමය;
   3. අපගේ ව්‍යාපාරික මෙහෙයුම්වල අඛණ්ඩතාව;
   4. යෝජිත විකුණුමකදී රහස්‍යභාවය රැක ගැනීම;
   5. ව්‍යාපාරයක් ඒකාබද්ධ කිරීම හෝ අත්පත් කර ගැනීම;
   6. ව්‍යාපාරික, නීතිමය, බදු හෝ රක්ෂණ අරමුණු සඳහා බලයලත් උපදේශකයන් හෝ විමර්ශකයන් සම්බන්ධ කර ගැනීම.
2) පහත සඳහන් දෑ සම්බන්ධයෙන් සැක සහිත හෝ සැබෑ උල්ලංඝනය කිරීම් වැළැක්වීම හෝ විමර්ශනය කිරීම:
   1. නීතිය (නීතිය බලාත්මක කරන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඇතුළුව);
   2. ගිවිසුම්; සහ/හෝ
   3. අපගේ ප්‍රතිපත්ති.
3) වෙනත් ආකාරයකින් අපව, අපගේ කාර්ය මණ්ඩලය හෝ වෙනත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හෝ නිදහස සුරක්ෂිත කිරීම හෝ ආරක්ෂා කිරීම.

**6. ස්වයංක්‍රීය තීරණ ගැනීම**

1. ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා සහ/හෝ ඔබ පිළිබඳ තීරණ ගැනීම සඳහා අප විසින් ස්වයංක්‍රීය මෙවලම් භාවිතා කරනු ලැබිය හැකිය. මෙම ස්වයංක්‍රීය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා යම් දුරකට මානුෂීය මැදිහත්වීමක් ඇතුළත් විය හැකිය.

2. නීතිය යටතේ අවසර ලබා දී ඇති අවස්ථාවලදී, පහත සඳහන් තත්ත්වයන් යටතේ අප විසින් ස්වයංක්‍රීය තීරණ ගැනීම් සිදු කරනු ලැබිය හැකිය:

1. කිසියම් තීරණයකට එළඹීමට පදනම් වූ මූලික ඉල්ලීම ඔබ විසින් ඉදිරිපත් කර ඇති බවට වන පූර්ව කොන්දේසිය මත, ගිවිසුමකට එළඹීමේ හෝ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් අප විසින් එම තීරණය ගනු ලබන අවස්ථාවලදී;
2. ඔබ විසින් ඒ සඳහා පැහැදිලි කැමැත්ත (explicit consent) ලබා දී ඇති විට; සහ/හෝ
3. ස්වයංක්‍රීය මෙවලම් භාවිතය වෙනත් ආකාරයකින් අවශ්‍ය වන විට.

## 7. ඔබගේ පෞද්ගලික දත්ත අන් අය සමඟ හුවමාරු කර ගැනීම

1. ඔබගේ පෞද්ගලික දත්ත අපගේ සේවකයන්, උපදේශකයන් සහ තාවකාලික වෛද්‍ය වෘත්තිකයන් (locum), නියෝජිතයන් සහ/හෝ අනුබද්ධිත ආයතන (affiliates) සමඟ හුවමාරු කරනු ලැබිය හැකිය.
2. පෞද්ගලික දත්ත වෙත ප්‍රවේශ වීම, මෙම නිවේදනයේ විස්තර කර ඇති අරමුණු සඳහා එම තොරතුරු දැනගැනීමට අවශ්‍යතාවයක් ඇති පුද්ගලයන්ට පමණක් සීමා කරනු ලැබේ
3. කලින් කලට, පහත සඳහන් පාර්ශවයන් ඇතුළුව බාහිර පාර්ශවයන් සමඟ ඔබගේ පෞද්ගලික දත්ත හුවමාරු කර ගැනීමට අපට අවශ්‍ය විය හැකිය:

    1. සේවා සපයන්නන්, විකුණුම්කරුවන් සහ සැපයුම්කරුවන්: අපගේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය නිෂ්පාදන සහ සේවාවන් අප වෙත සපයනු ලබන බලයලත් බාහිර පාර්ශවයන් හෝ සමාගම් සමඟ අප ගිවිසුම්ගතව සිටින්නෙමු
    2. ව්‍යාපාරික සහ සහයෝගීතා හවුල්කරුවන්: අප නිලවශයෙන් පිළිගත් (accredited) වෛද්‍යවරුන් සහ විශේෂඥයන් සමඟ කටයුතු කරන අතර, ඔවුන්ගේ සායනික කාර්ය මණ්ඩලය සහ පරිපාලකයන්, අපගේ ආයතනික සේවාලාභීන් සහ/හෝ හවුල්කරුවන් (සහ ඔවුන් විසින් පත් කරන ලද සේවා සපයන්නන් සහ/හෝ පාරිභෝගිකයන්), අධ්‍යාපන සහ පර්යේෂණ ආයතන මෙයට ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ ඒවාට.
    3. පොදු සහ රාජ්‍ය අධිකාරීන්: නීතියෙන් අවශ්‍ය වූ විට හෝ අපගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වූ විට, අපව නියාමනය කරනු ලබන හෝ අප කෙරෙහි අධිකරණ බලය සහිත පොදු සහ රාජ්‍ය අධිකාරීන් වෙත ඔබගේ පෞද්ගලික දත්ත හෙළිදරව් කරනු ලැබිය හැකිය.
    4. වෘත්තීය උපදේශකයන් සහ අනෙකුත් පාර්ශවයන්: බැංකු, රක්ෂණ සමාගම්, විගණකවරුන්, නීතිඥයන්, ගණකාධිකාරීවරුන්, සහ වැටුප් ලේඛන උපදේශකයන්, වෘත්තීය උපදේශකයන් වැනි ඇතැම් වෘත්තීය උපදේශකයන්ගෙන් අප සහය ලබන අතර ඔවුන් සමඟ එක්ව කටයුතු කරන්නෙමු. සහ/ හෝ;
    5. ආයතනික ගනුදෙනුවලට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්: ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක කොටසක් වෙනත් සමාගමකට විකිණීමකදී, හෝ අපගේ ව්‍යාපාරය, වත්කම් හෝ කොටස් සම්බන්ධ යම් ප්‍රතිසංවිධානයක් (reorganisation), ඒකාබද්ධ කිරීමක් (merger), ඒකාබද්ධ ව්‍යාපාරයක් (joint venture) හෝ වෙනත් ආකාරයක බැහැර කිරීමකදී (disposition) වැනි ආයතනික ගනුදෙනු අතරතුරදී ද, කලින් කලට ඔබගේ පෞද්ගලික දත්ත හුවමාරු කර ගැනීමට අපට සිදු විය හැකිය.

4. උචිත පරිදි, අප විසින් සපයනු ලබන ආරක්ෂණ මට්ටමට සමාන මට්ටමක ආරක්ෂාවක් සහතික වන පරිදි, ගිවිසුම්ගතව ඔබගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමට සහ සුරක්ෂිත කිරීමට අප පියවර ගනු ඇත.

## 8. පෞද්ගලික දත්ත දේශසීමා හරහා හුවමාරු කිරීම

1. ජාත්‍යන්තර ප්‍රමිති ආයතන සහ අනෙකුත් ව්‍යාපාර සමඟ අප පවත්වාගෙන යනු ලබන සබඳතා හේතුවෙන්, මෙම නිවේදනයේ දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා ලොව පුරා විවිධ රටවල සිටින අපගේ අනුබද්ධිත ආයතන සහ/හෝ බලයලත් බාහිර පාර්ශවයන් වෙත ඔබගේ පෞද්ගලික දත්ත වෙත ප්‍රවේශ වීමට හෝ එම දත්ත ඔවුන් වෙත හුවමාරු කිරීමට ඉඩ ලැබිය හැකිය.
2. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) යටතේ දක්වා ඇති ප්‍රමිතීන්ට වඩා වෙනස් දත්ත ආරක්ෂණ නීති සහ රීති පවතින ශ්‍රී ලංකාවෙන් බැහැර අධිකරණ ප්‍රදේශ (jurisdictions) වෙත ඔබගේ පෞද්ගලික දත්ත අප විසින් හුවමාරු කරනු ලැබිය හැකිය
3. ජාත්‍යන්තරව පිහිටා ඇති බලයලත් බාහිර පාර්ශවයක් වෙත පෞද්ගලික දත්ත හුවමාරු කරනු ලබන්නේ පහත සඳහන් දෑ සඳහා එය අවශ්‍ය හෝ උචිත බව අප විශ්වාස කරන්නේ නම් පමණි:
   1. අදාළ දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූල වීම සහතික කිරීම; මෙයට පොදු සහ රාජ්‍ය අධිකාරීන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම, නීතිය බලාත්මක කරන ආයතන (law enforcement agencies) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හෝ වෙනත් නීතිමය හේතූන් ඇතුළත් විය හැකිය.; සහ/හෝ
   2. අප විසින් පෞද්ගලික දත්ත රැස් කරන ලද අරමුණු ඉටු කර ගැනීම සඳහා හෝ අපගේ නියමයන් සහ කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා.

## 9. අප ඔබගේ පෞද්ගලික දත්ත රඳවා තබා ගන්නේ කොපමණ කාලයක් සඳහාද?

1. ඔබගේ පෞද්ගලික දත්ත රැස් කරන ලද අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන කාලය පුරාම අපි එම දත්ත ළඟ තබා ගන්නෙමු. අපි පෞද්ගලික දත්ත රඳවා තබා ගන්නේ පහත සඳහන් කාලසීමාවන් සඳහා පමණි:
   1. අදාළ සෞඛ්‍ය සේවා අරමුණු ඉටු කිරීමට අවශ්‍ය කාලසීමාව සඳහා;
   2. අදාළ නෛතික සහ/හෝ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට; සහ/හෝ
   3. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය නියාමන නීති මඟින් උපදෙස් ලබා දී ඇති පරිදි.
   4. දරුවෙකුගේ සෞඛ්‍ය තොරතුරු, එම දරුවාට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක්

5. ආරවුලක් හෝ යම් නීතිමය ගැටලුවක් පැන නැඟීමට ඉඩ ඇති අවස්ථාවන්හිදී.

2. අදාළ රඳවා තබා ගැනීමේ කාලසීමාව අවසන් වූ වහාම, ඔබගේ පෞද්ගලික දත්ත නිසි පරිදි:

1. බැහැර කරනු ලැබේ (disposed); සහ/හෝ
2. හඳුනාගත නොහැකි කරනු ලැබේ (de-identified).

## 10. අප ඔබගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කරන්නේ කෙසේද?

1. සකසනු ලබන (processed) පෞද්ගලික දත්තවල ආරක්ෂාව පවත්වා ගැනීමට අපි බැඳී සිටින අතර, පෞද්ගලික දත්ත සැකසීම මෙම නිවේදනය යටතේ විස්තර කර ඇති අරමුණු සඳහා සාධාරණ වූ, ප්‍රමාණවත් වූ සහ/හෝ අදාළ වන්නා වූ දත්ත/තොරතුරුවලට පමණක් සීමා කරන්නෙමු.

2. ඔබගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා අපි සුදුසු පියවර ගන්නා අතර, අප විසින් ඔබගේ පෞද්ගලික දත්ත හෙළිදරව් කරනු ලබන බාහිර පාර්ශවයන්ගෙන් ද එම පෞද්ගලික දත්තවල රහස්‍යභාවය සහ ආරක්ෂාව සුරක්ෂිත කරන ලෙස අපි අවධාරණය කරන්නෙමු. පවතින තත්ත්වය, ක්‍රියාත්මක කිරීමේ පිරිවැය සහ ආරක්ෂා කළ යුතු දත්ත/තොරතුරුවල ස්වභාවය අනුව, අනවසරයෙන් ප්‍රවේශ වීම, රැස් කිරීම, භාවිතය, හෙළිදරව් කිරීම, පිටපත් කිරීම, වෙනස් කිරීම, බැහැර කිරීම හෝ නැතිවීම වැනි අවදානම් වැළැක්වීම සඳහා අපි භෞතික, තාක්ෂණික සහ ආයතනික පියවරයන් ක්‍රියාත්මක කර ඇත.

3. අප සමඟ ඔබ පවත්වන සන්නිවේදනය තවදුරටත් ආරක්ෂිත නොවන බව විශ්වාස කිරීමට ඔබට කිසියම් හේතුවක් ඇත්නම්, කරුණාකර අපව සම්බන්ධ කරගන්න (සම්බන්ධ කරගත හැකි විස්තර පහත දැක්වේ).

## 11. ඔබ සතු අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා අපව සම්බන්ධ කරගන්නේ කෙසේද?

1. ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන්, ඔබගේ අනන්‍යතාවය සාර්ථකව තහවුරු කිරීමෙන් පසුව ඔබට පහත සඳහන් අයිතිවාසිකම් ක්‍රියාත්මක කළ හැකිය:

1. අදාළ කාල සීමාවන්ට යටත්ව සහ ඔබගේ ප්‍රවේශ ඉල්ලීම සැකසීමේ පිරිවැයට අදාළ ගාස්තුවලට යටත්ව (නීතියෙන් නියම කර ඇති පරිදි), ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හෝ ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඔබට ඇත. ඔබගේම පෞද්ගලික දත්ත සැකසීමට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම මඟින්, ඔබගේ සෞඛ්‍ය ගොනුවේ ඇතුළත් විය හැකි

තෙවන පාර්ශවයක තොරතුරු, වෘත්තීය මතයන්, රෝහලේ පුද්ගලික තොරතුරු සහ නීතිමය වශයෙන් සංවේදී දත්ත ලබා ගැනීමට ඔබට අයිතිවාසිකමක් හිමි නොවේ.
2. ඔබගේ පෞද්ගලික දත්ත යාවත්කාලීන කිරීමට හෝ නිවැරදි කිරීමේ අයිතිවාසිකම ඔබට ඇත. එසේ කරනු ලබන්නේ එවැනි නිවැරදි කිරීමක් සිදු කළ යුතු බවට සාධාරණ පදනමක් මත අප සෑහීමකට පත් වුවහොත් පමණි.
3. ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා ලබා දී ඇති කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමේ අයිතිවාසිකම, ඇතැම් සැකසීම් වර්ගවලට හෝ සියලුම සැකසීම්වලට විරුද්ධ වීමේ අයිතිවාසිකම සහ/හෝ ඔබගේ පෞද්ගලික දත්ත මකා දැමීමේ අයිතිවාසිකම ඔබට ඇත. ඔබගේ මෙම ඉල්ලීම නිසා අපට ලබා දිය හැකි නිෂ්පාදන සහ සේවාවන් කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවත්; සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කර ඇති පරිදි පෞද්ගලික වෛද්‍ය ආයතනයක් සියලුම ආයතනික වාර්තා රඳවා තබා ගත යුතු අනිවාර්ය කාල සීමාවෙන් පසුව එවැනි ඉල්ලීම් ක්‍රියාත්මක කළ හැකි බවත් කරුණාවෙන් සලකන්න.
4. කිසිදු මානුෂීය මැදිහත්වීමකින් තොරව ස්වයංක්‍රීය ක්‍රමවේදයන් පමණක් භාවිතා කරමින් අප ඔබ ගැන තීරණයක් ගන්නා අවස්ථාවකදී, එම තීරණය මඟින් ඔබගේ අයිතිවාසිකම්වලට ආපසු හැරවිය නොහැකි සහ අඛණ්ඩ බලපෑමක් ඇති කරන්නේ නම් හෝ ඇති කිරීමට ඉඩ තිබේ නම්, මානුෂීය මැදිහත්වීමක් සහිතව එම තීරණය නැවත සමාලෝචනය කරන ලෙස ඉල්ලා සිටීමේ අයිතිවාසිකම ඔබට ඇත.

2. ඔබගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔබට කිසියම් විමසීමක්, ඉල්ලීමක්, ප්‍රතිචාරයක් හෝ පැමිණිල්ලක් ඇත්නම්, කරුණාකර පහත සඳහන් නාලිකා ඔස්සේ දත්ත ආරක්ෂණ කාර්යාලය (Data Protection Office) සම්බන්ධ කරගන්න

1. දු.ක - +94 112 140000 (දිගුව 2637)
2. ඊමේල් - dpo@durdans.com
3. ලිඛිත සන්නිවේදනයන් පහත ලිපිනයට තැපැල් කළ හැකිය: දත්ත ආරක්ෂණ නිලධාරී, ඩර්ඩන්ස් රෝහල, අංක 03, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03, ශ්‍රී ලංකාව.

3. ඔබගේ විමසීම, ඉල්ලීම, ප්‍රතිචාරය හෝ පැමිණිල්ල අප වෙත ලැබුණු දින සිට සාධාරණ කාලයක් ඇතුළත සහ උපරිම වශයෙන් දින 30ක් නොඉක්මවන කාලයකදී ඔබට ප්‍රතිචාර දැක්වීමට අපි අපගේ උපරිමය කරන්නෙමු. එහි පවතින සංකීර්ණභාවය අනුව, නීතියෙන් ප්‍රතිපාදන සලසා ඇති පරිදි කාල සීමාවන් දීර්ඝ කර ගැනීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

4. ඩර්ඩන්ස් රෝහල් සමූහ කළමනාකාරීත්වයේ හෝ එහි දත්ත ආරක්ෂණ නිලධාරියාගේ ප්‍රතිචාරයට (feedback) එරෙහිව, කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා (BMICH) පරිශ්‍රයේ පිහිටි ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය වෙත අභියාචනා කිරීමේ අයිතිවාසිකම ඔබට ඇත.

5. ඔබගේ අයිතිවාසිකම් සහ නිදහසට අවදානමක් ඇති විය හැකි ආකාරයේ පෞද්ගලික දත්ත කඩ කිරීමකදී (personal data breach), නෛතික අවශ්‍යතාවලට අනුකූලව ඒ පිළිබඳව ඔබව සහ අදාළ අධිකාරීන් දැනුවත් කිරීමට අපි පියවර ගන්නෙමු.

## 12. නිවේදනයේ යාවත්කාලීන කිරීම්

අපි කලින් කලට මෙම නිවේදනය සංශෝධනය කරනු ලැබිය හැකිය. අප විසින් සංශෝධිත නිවේදනය අපගේ වෙබ් අඩවියේ පළ කළ විට, එම වෙනස්කම් බලාත්මක දින (Effective Date) සිට ක්‍රියාත්මක වනු ඇත. යම් වෙනස්කම් සිදුවී ඇත්දැයි දැනගැනීම සඳහා වරින් වර මෙම නිවේදනය සමාලෝචනය කිරීම වඩාත් වැදගත් බව කාරුණිකව දන්වා සිටිමු.

## පරිශිෂ්ටය 1: රැස් කරනු ලැබිය හැකි පෞද්ගලික දත්ත

1.1 අපගේ රෝගීන්ගේ නම, උපන් දිනය, ස්ත්‍රී/පුරුෂ භාවය, ජාතිකත්වය වැනි මූලික පෞද්ගලික තොරතුරු සහ ජාතික හැඳුනුම්පත් අංක, ගමන් බලපත්‍ර අංක වැනි හඳුනා ගැනීමේ අංක.

1.2 ලිපිනය, දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපින වැනි සම්බන්ධ කරගත හැකි තොරතුරු

1.3 IP ලිපින, වෙබ් අඩවි පරිශීලන රටාවන් සහ කුකීස් (cookies) හරහා රැස් කරනු ලබන මාර්ගගත හඳුන්වනයන් (online identifiers) වැනි ඩිජිටල් දත්ත

1.4 ගෙවීම් විස්තර (බැංකු ගිණුම් අංක සහ ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ් අංක ආදිය), බිල්පත් වාර්තා සහ රක්ෂණ හිමිකම් (insurance claims) වැනි මූල්‍ය දත්ත.

1.5 වෛද්‍ය ඉතිහාසය, රෝග ලක්ෂණ, රෝගී තත්ත්වයන්, වෛද්‍ය වාර්තා, රෝග විනිශ්චය වාර්තා, බෙහෙත් වට්ටෝරු, පරීක්ෂණ ප්‍රතිඵල, ප්‍රතිකාර ඉතිහාසය, ජෛවමිතික (biometric) දත්ත, ස්කෑන් පරීක්ෂණ, ඡායාරූප, ඔබගේ අසාත්මිකතාවන්, ආහාර මනාපයන් සහ විශේෂ අවශ්‍යතා මෙන්ම රක්ෂණ හිමිකම්වලට අදාළ තොරතුරු වැනි සෞඛ්‍ය දත්ත.

**1.6** නීත්‍යානුකූල භාරකරු හරහා ලබාගන්නා දරුවන්ගේ පෞද්ගලික දත්ත.

**1.7** රැකියා අයදුම්පත්, සංචාරක විස්තර, අධ්‍යාපනය, අභ්‍යන්තර හෝ බාහිර සන්නිවේදනයන්ගෙන් ලැබෙන දත්ත, සේවා ඉතිහාසය, වැටුප් විස්තර, බදු විස්තර, ළඟම ඥාතීන්ගේ තොරතුරු, කලත්‍රයා සහ දරුවන්ගේ තොරතුරු, සේවයට බඳවා ගැනීමේ සහ සේවයෙන් ඉවත් වීමේ සම්මුඛ පරීක්ෂණ වාර්තා මෙන්ම කාර්ය සාධන වාර්තා වැනි රැකියාවට අදාළ තොරතුරු.

**1.8** සීසීටීවී (CCTV) දර්ශන සහ ඇමතුම් පටිගත කිරීම්, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සහතික කිරීම් (testimonials) ඇතුළු සමාජ මාධ්‍යවල පළ කරන ලද අදහස්.

**1.9** මුහුණේ රූප, ඇඟිලි සලකුණු සහ ඇසේ ඉඟිරියාව (iris) ආශ්‍රිත දත්ත.

## පරිශිෂ්ටය 2: පෞද්ගලික දත්ත සකසනු ලබන අරමුණු

| පෞද්ගලික දත්ත සකසනු ලබන අරමුණු | නිදසුන් |
|---|---|
| වෛද්‍ය සේවාවන් සැපයීමේ අරමුණ | <u>වෛද්‍ය ප්‍රතිකාර සහ අනෙකුත් අදාළ සේවාවන් සැපයීම සඳහා ඇගයීම:</u> ඔබ මීට පෙර ඩර්ඩන්ස් රසායනාගාර හෝ රෝහල වෙත පැමිණ ඇත්නම්, ඔබගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන ඇගයීම් ක්‍රියාවලිය අපගේ පද්ධතිය තුළ විධිමත් කිරීම සඳහා, පෙර ලියාපදිංචියේදී හෝ ඇතුළත් වීමේදී අප ලබාගත් ඔබගේ පෞද්ගලික දත්ත (ලිපිනය සහ සම්බන්ධ කරගත හැකි විස්තර වැනි) භාවිතා කරනු ලැබිය හැකිය. මෙම ඇගයීම අපගේ හෝ තෙවන පාර්ශවීය වෛද්‍ය වෘත්තිකයෙකු විසින් සිදු කරනු ලැබ පද්ධතියට ඇතුළත් කර තිබීම නොසලකා, එවැනි පූර්ව ලියාපදිංචි දත්ත භාවිත කරනු ලැබේ.<br><br>ඩර්ඩන්ස් ආයතනයක් තුළදී, අපගේ දුරකථන/වීඩියෝ වෛද්‍ය උපදේශන සේවා (teleconsult services) හරහා හෝ අපගේ නිවාස සත්කාරක සේවා (homecare services) හරහා වෛද්‍ය සේවාවන් ලබා ගැනීමට ඔබ සතු සුදුසුකම ඇගයීමේ අරමුණින් අපි ඔබගේ පෞද්ගලික දත්ත රැස් කරනු ලැබිය හැකිය. ඔබගේ පෞද්ගලික දත්ත රැස් කරනු ලැබුවද ඔබ අපගේ රෝගියෙකු බවට පත් නොවන අවස්ථාවකදී, එම දත්ත විනාශ කිරීමට පෙර සීමිත කාලයක් සඳහා ගබඩා කර තබා ගනු ලැබිය හැකිය. ඔබගේ ඇගයීම කිසියම් වෛද්‍ය වෘත්තිකයෙකුගේ ඉල්ලීම මත සිදු කර ඇත්නම්, එම ඇගයීමේ ප්‍රතිඵලය ඔවුන් විසින් ඔබට ලබා දෙනු ලබන ප්‍රතිකාර හෝ සත්කාර සඳහා අදාළ විය හැකි බැවින්, එම ප්‍රතිඵලය අපි එම වෛද්‍යවරයා වෙත වාර්තා කරනු ලැබිය හැකිය. |

ඔබ ඩර්ඩන්ස් ආයතනයකට ඇතුළත්ව සිටින අතරතුර, අපගේ දුරකථන/වීඩියෝ වෛද්‍ය උපදේශන සේවා හෝ නිවාස සත්කාරක සේවා හරහා තෙවන පාර්ශවීය සේවා සපයන්නෙකු (උදාහරණයක් ලෙස, අපගේ සේවයේ නොමැති ඔබගේ පෞද්ගලික වෛද්‍යවරයෙකු හෝ විශේෂඥ වෛද්‍ය සේවා සපයන්නෙකු) මගින් ඇගයීමකට භාජනය වන්නේ නම්, ඔබගේ සත්කාරක කටයුතු එම තෙවන පාර්ශවය වෙත පැවරීමේ අරමුණින් අපි ඔබගේ පෞද්ගලික දත්ත එම තෙවන පාර්ශවීය සේවා සපයන්නා වෙත හෙළිදරව් කරනු ලැබිය හැකිය.

<u>වෛද්‍ය ප්‍රතිකාර සහ අදාළ සේවාවන් සැපයීම:</u> ඩර්ඩන්ස් ආයතනයක් තුළදී, අපගේ දුරකථන/වීඩියෝ වෛද්‍ය උපදේශන සේවා හෝ නිවාස සත්කාරක සේවා හරහා ඔබට සත්කාර හෝ ප්‍රතිකාර ලබා දෙන, හෝ ඔබට වෛද්‍ය ප්‍රතිකාර සහ අදාළ සේවාවන් ලබා ගැනීම සඳහා යොමු කිරීමක් (referral) ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය වෘත්තිකයන් (ඩර්ඩන්ස් ආයතනයෙහි සේවයේ නොමැති තෙවන පාර්ශවයන් ද ඇතුළුව) සහ අප අතර ඔබගේ පෞද්ගලික දත්ත රැස් කිරීම, භාවිත කිරීම, හෙළිදරව් කිරීම හෝ සැකසීම සිදු කරනු ලැබිය හැකිය.. වෛද්‍ය ප්‍රතිකාර සහ අදාළ සේවාවන් යන්නට ඖෂධවේදී සේවාවන් සහ අනුබද්ධ සෞඛ්‍ය වෘත්තීය සේවාවන් ද ඇතුළත් වේ.

ඔබ ඩර්ඩන්ස් ආයතනයෙන් බැහැර වෛද්‍යවරයෙකු හෝ සෞඛ්‍ය පහසුකම් සපයන ආයතනයක් මගින් ප්‍රතිකාර ලබන්නේ නම් සහ ඔවුන්ට ඩර්ඩන්ස් ආයතනයක් තුළ ඔබ ලැබූ ප්‍රතිකාර පිළිබඳ සෞඛ්‍ය වාර්තා ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, එම වෛද්‍යවරයාට හෝ ආයතනයට ඔබගේ වාර්තාවේ පිටපතක් ලබා දීම සඳහා අපට ඔබගේ අවසරය අවශ්‍ය වනු ඇත.

ඔබට වෛද්‍ය ප්‍රතිකාර සහ අදාළ සේවාවන් ලබා දීමේදී, වැඩිදුර පරීක්ෂණ සඳහා (උදා: විකිරණ විද්‍යාව වැනි රෝග විනිශ්චය පරීක්ෂණ) ඔබව යොමු කිරීමට අපට සිදුවිය හැකි අතර, ඔබගේ රෝග විනිශ්චය හෝ ප්‍රතිකාර සම්බන්ධයෙන් සෞඛ්‍ය තොරතුරු සහ සායනික රූප (clinical images) යැවීම ඇතුළුව, වෛද්‍ය විශේෂඥයන් සමඟ (ඔවුන් ඩර්ඩන්ස් යටතේ සිටියත් නැතත්, සහ ඔවුන් ශ්‍රී ලංකාවේ හෝ දුරස්ථව සිටියත්) සාකච්ඡා කිරීමට අපගේ කාර්ය මණ්ඩලයට සිදුවිය හැකිය. එසේම, ඔබ ලියාපදිංචි වී සිටින කාලය තුළ, රෝහලට ඇතුළත්ව සිටින කාලය තුළ සහ ඉන් පසුව ලබා ගන්නා වැඩිදුර ප්‍රතිකාර සඳහා (නිදසුනක් ලෙස, භෞතචිකිත්සකයෙකු (physiotherapist) වෙත හෝ බාහිර රෝගී අංශය (outpatient) වෙත හෝ ඒ හා සම්බන්ධ සෞඛ්‍ය සේවාවන් වෙත) වෙනත් බාහිර හෝ අනුබද්ධිත සෞඛ්‍ය සේවා සපයන්නන් වෙත ඔබව යොමු කිරීමට අපට සිදුවිය හැකිය. එවැනි යොමු කිරීමක් සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට (ඉලෙක්ට්‍රොනිකව දත්ත හෙළිදරව් කිරීම ඇතුළුව) ඔබගේ පෞද්ගලික දත්ත අදාළ සේවා සපයන්නා වෙත හෙළිදරව් කිරීමට අපට සිදුවිය හැකිය.

ඔබගේ පෞද්ගලික දත්ත හෙළිදරව් කරනු ලබන්නේ, ඔබගේ ප්‍රතිකාරවලට සහ ඒ හා සම්බන්ධ පරිපාලන කටයුතුවලට සම්බන්ධ වන හෝ ඒ පිළිබඳව උපදෙස් ලබා ගන්නා සෞඛ්‍ය වෘත්තිකයන් වෙත පමණක් වන අතර, එය එම අරමුණ ඉටු කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට පමණක් (බහුවිධ කණ්ඩායම් රැස්වීම්වලට සහභාගී වීම ඇතුළුව) සීමා වේ. ඇතැම් අවස්ථාවලදී, ආරක්ෂිත ද්වාර (secure portal) හෝ යෙදුම් (applications) හරහා මෙම තොරතුරු ඉලෙක්ට්‍රොනිකව ලබා දීමට පියවර ගනු ඇත. මෙම සෞඛ්‍ය වෘත්තිකයන් ඔබගේ ප්‍රතිකාර ලබා දීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ඔබගේ පෞද්ගලික දත්ත භාවිත කිරීම සහ/හෝ හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. අප මෙය සිදු කරනු ලබන්නේ, නීතියට අනුකූලව මෙම සියලු දත්තවල රහස්‍යභාවය පවත්වා ගනිමින් සහ ඔබගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමිනි

ඔබගේ ප්‍රතිකාරයේ කොටසක් ලෙස ඔබට කෘත්‍රිම අවයවයක් (prosthesis) හෝ වෛද්‍යමය වශයෙන් සිරුරේ තැන්පත් කරන නිෂ්පාදනයක් (medical implantable product) අවශ්‍ය වන්නේ නම්, එම නිෂ්පාදනය නිසි පරිදි සැපයීම සහ පසුව සිදු කරන පසු විපරම් කටයුතු සඳහා, ඇතැම් අවස්ථාවලදී අප ඔබගේ පෞද්ගලික දත්ත එම නිෂ්පාදකයා හෝ සැපයුම්කරු වෙත හෙළිදරව් කිරීමට ඉඩ ඇත.

<u>අනුමත වෛද්‍යවරයෙකුට ඔබේ වෛද්‍ය වාර්තා වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම හෝ ප්‍රවේශය ලබා දීම:</u>
ඔබ සහ සෞඛ්‍ය සේවා සපයන්නෙකු/වෛද්‍යවරයෙකු අතර පවතින රෝගී-සත්කාර හෝ වෛද්‍ය-රෝගී සබඳතාවක් මත පදනම්ව, ඩර්ඩන්ස් ආයතනයෙන් බැහැර වෛද්‍යවරයෙකු (උදා: විශේෂඥ වෛද්‍යවරයෙකු හෝ සාමාන්‍ය වෛද්‍යවරයෙකු) මඟින් ඔබ ප්‍රතිකාර ලබනු ලැබිය හැකිය ("අනුමත වෛද්‍යවරයා"). මෙම සබඳතාවය රෝහලට ඇතුළත් වීමට පෙර සහ පසු කාලසීමාවන් ආවරණය කරන අතර, පහත සඳහන් ඕනෑම අවස්ථාවකදී එවැනි සබඳතාවක් ස්ථාපිත විය හැකිය: (i) අනුමත වෛද්‍යවරයා විසින් වෛද්‍ය සහ අනෙකුත් අදාළ සේවාවන් සඳහා ප්‍රථම වරට ඔබව ඩර්ඩන්ස් ආයතනයක් වෙත යොමු කිරීමේදී; (ii) අනුමත වෛද්‍යවරයාට ප්‍රවේශය ලබා දෙන ලෙස ඉල්ලා ඔබ විසින් අවසර පත්‍රයක් (authorisation form) ලබා දීමේදී; හෝ (iii) අනුමත වෛද්‍යවරයා විසින් ඔබගේ පෞද්ගලික දත්ත තවත් වෛද්‍යවරයෙකු සමඟ බෙදා ගැනීම ආරම්භ කිරීමේදී.

ඉහත කරුණු මත පදනම්ව, ඔබගේ වෛද්‍ය වාර්තා (ඔබගේ ජීව දත්ත (biodata) සහ සායනික ස්කෑන් පරීක්ෂණ/ප්‍රතිඵල ඇතුළුව) අනුමත වෛද්‍යවරයාට ලබා දීමට හෝ ඒ සඳහා ප්‍රවේශය ලබා දීමට අපට හැකියාව ඇත. මෙහි අරමුණ වන්නේ අනුමත වෛද්‍යවරයා විසින් ඔබට ලබා දෙන සත්කාර හෝ ප්‍රතිකාර සඳහා පහසුකම් සැලසීමයි.

ඔබගේ වෛද්‍ය තොරතුරුවල පිටපතක් අනුමත වෛද්‍යවරයා වෙත ලබා දීමට ඔබ අකමැති නම්, ඒ බව අපට දැනුම් දිය යුතුය.

ඔබේ ජීවිතයට හෝ සෞඛ්‍යයට අවදානමක් ඇති හදිසි අවස්ථාවකදී, ඔබට අවසරය ලබා දීමට නොහැකි නම් හෝ නීතියෙන් අවසර දී ඇති පරිදි, ඔබගේ අවසරයකින් තොරව ඩර්ඩන්ස් ආයතනයෙන් බැහැර වෙනත් වෛද්‍යවරයෙකු හෝ සෞඛ්‍ය පහසුකම් සපයන ආයතනයක් වෙත ඔබගේ සෞඛ්‍ය වාර්තා පිළිබඳ තොරතුරු ලබා දීමට අපට හැකියාව ඇත

ඔබගේ ලේඛන ඩිජිටල් ක්‍රමවේද හරහා ඔබට ලබා දීම: ඔබට ලබා දෙන සේවාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, වෙබ් ද්වාර (web portal), විද්‍යුත් තැපෑල (emails) හෝ ජංගම දුරකථන යෙදුම් (mobile applications) හරහා තෝරාගත් ලේඛන ඔබට ලබා ගැනීමට අපට සැලැස්විය හැකිය. මේ සම්බන්ධයෙන්, ඔබගේ පෞද්ගලික දත්ත භාවිත කිරීම, රැස් කිරීම, හෙළිදරව් කිරීම හෝ සැකසීම සිදු කළ හැකි අතර, එම අරමුණ සඳහා අදාළ දත්ත ගබඩාවන් (databases) වෙත ඔබගේ පෞද්ගලික දත්ත සම්ප්‍රේෂණය කිරීම ද සිදු කරනු ලැබිය හැකිය. එවැනි ලේඛනයක් ඔබ වෙත ලබා දීමට සූදානම් වූ විට, ඔබ අප වෙත ලබා දී ඇති දුරකථන අංකයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට ඇමතුමක්, කෙටි පණිවිඩයක් හෝ විද්‍යුත් පණිවිඩයක් මගින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කිරීමට අපට හැකියාව ඇත.

ඔබ පිළිබඳ තොරතුරු ඔබේ නීත්‍යානුකූල නියෝජිතයන් හෝ ළඟම ඥාතීන් (next of kin) වෙත ලබා දීම**:** එවැනි කිසිදු පුද්ගලයෙකුට ඔබගේ පෞද්ගලික දත්ත හෙළිදරව් කිරීමට ඔබ අකමැති බව අපට දන්වා නොමැති නම්, ඔබගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඔබේ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ලබා දීමට අපට හැකියාව ඇත. රෝහලට ඇතුළත් වන අවස්ථාවේදී අත්සන් කරන භාරකරු (guardian) හෝ ඔබ විසින් නම් කරනු ලබන වෙනත් ඕනෑම සාමාජිකයෙකු නීත්‍යානුකූල නියෝජිතයා ලෙස සලකනු ලැබේ.

ඩර්ඩන්ස් ආයතන (entities) අතර පෞද්ගලික දත්ත බෙදාගැනීම: මෙම නිවේදනයේ සඳහන් කර ඇති ඕනෑම අරමුණක් සඳහා අපගේ විවිධ පහසුකම් සපයන මධ්‍යස්ථාන හෝ අනුබද්ධ ආයතන අතර ඔබගේ පෞද්ගලික දත්ත බෙදාගැනීමට අපට හැකියාව ඇත. එයට පහත කරුණු ඇතුළත් වේ:

i. ඩර්ඩන්ස් ආයතන සමූහය තුළ පොදු සේවාවන් (උදා: මානව සම්පත්, තොරතුරු තාක්ෂණ, මූල්‍ය සහ අභ්‍යන්තර විගණන කටයුතු) සැපයීම සඳහා අනෙකුත් ඩර්ඩන්ස් ආයතන මඟින් රැස් කරනු ලබන ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම;

ii. සමූහ කළමනාකරණ කටයුතු සිදුකරන ඩර්ඩන්ස් ආයතනයක් විසින්, එහි වාර්තාකරණ කටයුතු සඳහා (උදා: අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා හෝ අවශ්‍ය වාර්තාකරණයන් සඳහා සංඛ්‍යාලේඛන සකස් කිරීම) අනෙකුත් අනුබද්ධ ආයතන මඟින් රැස් කරන ලද පෞද්ගලික දත්ත රැස් කිරීම සහ භාවිත කිරීම;

iii. ඩර්ඩන්ස් ආයතනයක් විසින් එහි දත්ත (ඔබගේ පෞද්ගලික දත්ත ද ඇතුළුව) සැකසීම සඳහා එකම තොරතුරු තාක්ෂණ පද්ධති සහ දත්ත ගබඩාවන් (e.g., SAP පද්ධතිය හෝ අදාළ ඕනෑම වෛද්‍ය වාර්තා පද්ධතියක්) භාවිත කරන අවස්ථාවන්හිදී; සහ

iv. ඔබට වෛද්‍ය සේවාවන් සැපයීමට පහසුකම් සැලසීම සඳහා, එක් ඩර්ඩන්ස් මධ්‍යස්ථානයකින් හෝ ආයතනයකින් රැස් කරන ලද ඔබගේ පෞද්ගලික දත්ත තවත් ඩර්ඩන්ස් මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් විසින් භාවිත කිරීම සඳහා එක් දත්ත ගබඩාවකට ඒකාබද්ධ කිරීම.

රජයේ ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම්ගත සේවාවන්: රජය සමඟ ඇති කරගත් ගිවිසුම් යටතේ විවිධ පුද්ගල කණ්ඩායම් වෙත සෞඛ්‍ය සේවාවන් සැපයීමට අපට හැකියාව ඇත. එවැනි එකඟතාවන් යටතේ ඔබ අපගෙන් සේවාවන් ලබා ගන්නා විට, එම ගිවිසුම්වල අවශ්‍යතාවයන්ට අනුකූලව ඔබගේ පෞද්ගලික දත්ත (ඇතැම් අවස්ථාවලදී අදාළ ඇතුළත් වීමට අදාළ වෛද්‍ය වාර්තාවේ පිටපතක් ද ඇතුළුව) අපි එම රජයේ ආයතන වෙත ලබා දෙන්නෙමු.

අපගේ ආයතනයක් තෙවන පාර්ශවයකට විකිණීම හෝ පැවරීම: අපගේ එක් ආයතනයක කළමනාකාරීත්වය හෝ අයිතිය අප විසින් තෙවන පාර්ශවයකට විකුණනු ලබන හෝ පවරනු ලබන අවස්ථාවකදී, ඔබගේ පෞද්ගලික දත්ත (උදා: ඔබගේ වෛද්‍ය වාර්තා) නව ක්‍රියාකරු වෙත පැවරීමට අපට හැකියාව ඇත. මෙම ඡේදය යටතේ ඔබගේ පෞද්ගලික දත්ත තෙවන පාර්ශවයකට හෙළිදරව් කරනු ලබන අවස්ථාවකදී, ඒ පිළිබඳව ඔබව දැනුවත් කිරීමට අපි අවශ්‍ය පියවර ගන්නෙමු.

සායනික පරීක්ෂණ සඳහා ආරාධනා කිරීම සහ සහභාගී වීම: ඔබ ලබන වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ විය හැකි සායනික පරීක්ෂණ (clinical trials) පිළිබඳව ඇතැම් අවස්ථාවලදී අප දැනුවත් විය හැකිය. එවැනි පරීක්ෂණ සඳහා සහභාගී වීම ස්වේච්ඡාවෙන් සිදු වන්නක් වන අතර, එවැනි පරීක්ෂණයකට ඔබව ඇතුළත් කර ගැනීමට පෙර අපි ඔබගේ කැමැත්ත ලබා ගන්නෙමු. සායනික පරීක්ෂණය පිළිබඳ මූලික තොරතුරු ඔබට ලබා දීම සඳහා, එම සායනික පරීක්ෂණයට සහභාගී වීමට ඔබ සතු සුදුසුකම ඇගයීමට අපට ඔබගේ පෞද්ගලික දත්ත භාවිත කළ හැකිය.

වෙනත් පොදු භාවිතයන්: පහත සඳහන් අවස්ථාවලදී අවශ්‍ය පරිදි ඔබගේ පෞද්ගලික දත්ත රැස් කිරීම, භාවිත කිරීම, හෙළිදරව් කිරීම හෝ සැකසීම අප විසින් සිදු කරනු ලැබිය හැකිය:

i. ඔබට නිර්දේශ කරන ලද හෝ ලබා දෙන ලද ඕනෑම වෛද්‍ය සේවාවකට අදාළ වෛද්‍ය ගාස්තු හිමිකම් (claims) සහ ඔබේ රෝගී තත්ත්වය කළමනාකරණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා, තෙවන පාර්ශවීය පරිපාලකයන් (TPAs), රක්ෂණ සමාගම් හෝ වෛද්‍ය සේවා සඳහා ගෙවීම් අනුමත කරන පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම;

ii. ඔබේ වෛද්‍ය ඉතිරිකිරීමේ ක්‍රමවේද (medical saving scheme) පරිපාලක සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඔබට ලබා දුන් ප්‍රතිකාර තහවුරු කිරීම සඳහා අදාළ තොරතුරු එම පරිපාලක වෙත ලබා දීම;

iii. බිල්පත් යාවත්කාලීන කිරීම්, රෝහලෙන් පිටව ගිය පසු සිදුකරන යාවත්කාලීන කිරීම් / පසු විපරම් කටයුතු , හදිසි අවස්ථා හෝ වෙනත් වෛද්‍යමය අරමුණු සහ ඔබේ වෛද්‍ය වාර්තා හෝ වෙනත් ලේඛන සූදානම් බව දැනුම් දීම සඳහා, ඔබ අප වෙත ලබා දී ඇති දුරකථන අංකයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට ඇමතුමක්, කෙටි පණිවිඩයක් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් ඔබව හෝ ඔබ විසින් පත් කරන ලද ප්‍රධාන සම්බන්ධීකාරක පුද්ගලයා සම්බන්ධ කර ගැනීම;

iv. ඔබේ වෛද්‍ය ඉතිරිකිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැදගත් තොරතුරු සහ අපගේ ආයතනය (facility) තුළ ඔබ ලබන සත්කාරවලට අදාළ මූල්‍ය හෝ කළමනාකරණ බලපෑම් පිළිබඳව ඔබ සමඟ සන්නිවේදනය කිරීම;

v. වාචිකව, විද්‍යුත් තැපෑලෙන් හෝ සමාජ මාධ්‍ය හරහා ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ කටයුතු සඳහා සහ ඔබ වාට්ටුවේ ප්‍රතිකාර ලබන අතරතුර ඉදිරිපත් කරන පැමිණිලි විමර්ශනය කිරීමේදී දත්ත භාවිත කිරීම;

vi. ගුවන් ගමන් සඳහා සුදුසු බව තහවුරු කරන ලිපි (‘fit to fly’ letters), වෛද්‍ය වාර්තා ආදිය විදේශීය වෛද්‍ය සේවාවක් හෝ සමාගමක් සමඟ බෙදා ගැනීම. ඔබගේ පෞද්ගලික දත්ත ශ්‍රී ලංකාවෙන් බැහැරට සම්ප්‍රේෂණය වන අවස්ථාවලදී, අදාළ දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූලව ඔබේ දත්ත ආරක්ෂා කිරීමට සුදුසු ආරක්ෂණ ක්‍රමවේදයන් පවතින බවට අපි සහතික වන්නෙමු. මෙලෙස දේශසීමා හරහා සිදුවන දත්ත හුවමාරු පිළිබඳව ඔබව දැනුවත් කරනු ලැබේ;

| | |
|---|---|
| | vii. හෙදියන්, පරිපාලන කාර්ය මණ්ඩලය ආදිය පුහුණු කිරීමේ අරමුණු සඳහා. |
| ව්‍යාපාරික අරමුණු | ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පෞද්ගලික දත්ත සැකසීම (Processing), ඉන්වොයිස් නිකුත් කිරීම, බිල්පත් සැකසීම සහ පුද්ගලයන්ගේ ගිණුම් කළමනාකරණය, පාරිභෝගික සේවය සහ සහාය ලබා දීම, මූල්‍ය සහ ගිණුම්කරණ කටයුතු, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, අභ්‍යන්තර කළමනාකරණය සහ පාලනය, සහ වෙනත් ඕනෑම සාධාරණ ලෙස අදාළ වන ක්‍රියාකාරකම් සඳහා ඔබගේ දත්ත භාවිතා කරනු ලැබිය හැකිය.<br><br>ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සැකසීම, ඉන්වොයිස් නිකුත් කිරීම, බිල්පත් සැකසීම සහ පුද්ගලයන්ගේ ගිණුම් කළමනාකරණය, පාරිභෝගික සේවය සහ සහාය ලබා දීම, මූල්‍ය සහ ගිණුම්කරණ කටයුතු, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, අභ්‍යන්තර කළමනාකරණය සහ පාලනය, සහ වෙනත් ඕනෑම සාධාරණ ලෙස අදාළ වන ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ. |
| ගිවිසුම්ගත බැඳීම් සහ අවශ්‍යතාව | වෛද්‍ය සත්කාර, සෞඛ්‍ය සහ යහපැවැත්මේ සේවාවන් සැපයීම සහ පරිපාලනය කිරීම මෙයට ඖෂධ ඇණවුම් කිරීම සහ ලබා දීම (ordering and providing medication), වෛද්‍ය පරීක්ෂණ, ස්කෑන් පරීක්ෂණ, වාර්තා, සමාලෝචන, උපදේශන, චිකිත්සා සහ වෛද්‍ය ක්‍රියාපටිපාටි ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ; එවැනි සහ ඒ හා සම්බන්ධ නිෂ්පාදන සහ සේවාවන් සැපයීම සඳහා තෙවන පාර්ශවීය සේවා සපයන්නන්, විකුණුම්කරුවන්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික සහ සහයෝගීතා හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම; සහ ඒ හා සම්බන්ධ ලේඛන සහ වාර්තා පවත්වාගෙන යාම. |
| පුද්ගලයන්ගේ ගිණුම් කළමනාකරණය: | ගිණුම් චරිත (account profiles) සහ තොරතුරු නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම; මෙයට සෞඛ්‍ය, වෛද්‍ය, ප්‍රතිලාභ හිමිකම් (benefits entitlement), ප්‍රතීතනය (accreditation), ගනුදෙනු (විමසීම් සහ ප්‍රතිපෝෂණ, හමුවීම්, ඇතුළත් වීම්, බිල්පත්, මිලදී ගැනීම් සහ/හෝ ගෙවීම්, රක්ෂණ හිමිකම් ආදිය) වාර්තා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ; ග්‍රාහකත්ව (subscriptions), ලියාපදිංචි කිරීම්, අයදුම්පත්, ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සහ අවසන් කිරීම, සහ පාරිභෝගික සේවය සහ සහාය ලබා දීම ඇතුළු ඉල්ලීම් සැකසීමට (processing) පහසුකම් සැලසීම සඳහා මෙය සිදු කරනු ලබයි. |
| පාරිභෝගික සේවය සහ සහාය | විමසීම්, ප්‍රතිපෝෂණ  සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම; වෙන්කරවා ගැනීම් (bookings), ලියාපදිංචි කිරීම් සහ අයදුම්පත් සඳහා කටයුතු සම්පාදනය කිරීම සහ පහසුකම් සැලසීම; දැනුම්දීම් සහ මතක් කිරීම් (reminders) ලබා දීම; සහ ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට සහ ගිණුම් සහ සබඳතා කළමනාකරණයට අදාළ වන වෙනත් ඕනෑම සාධාරණ ඉල්ලීම් සහ කරුණු සඳහා සහාය ලබා දීම මෙයට ඇතුළත් වේ. |

| | |
|---|---|
| මූල්‍ය සහ ගිණුම්කරණය | පුද්ගලයන්, සේවා සපයන්නන්, විකුණුම්කරුවන්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික සහ සහයෝගීතා හවුල්කරුවන් වෙත ගෙවීම් සිදු කිරීම සහ ඔවුන්ගෙන් ගෙවීම් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම; ණය අයකර ගැනීම සහ කළමනාකරණය සහ වෙනත් ඕනෑම සාධාරණ ලෙස අදාළ වන කරුණු මෙයට ඇතුළත් වේ. |
| පර්යේෂණ සහ සංවර්ධනය | නිෂ්පාදන සහ සේවා පරිභෝජනය, රටාවන් සහ ප්‍රවණතාවන් පිළිබඳ තොරතුරු සමාලෝචනය කිරීම, අධ්‍යයනය කිරීම, විශ්ලේෂණය කිරීම, විශ්ලේෂණාත්මක දත්ත සකස් කිරීම (perform analytics) සහ/හෝ එම තොරතුරු ඒකාබද්ධ කිරීම; පුද්ගල චර්යා රටා (behavioural patterns) සහ මනාපයන් අධ්‍යයනය කිරීම; මෙහෙයුම් කටයුතු, සේවාවන් සහ නිෂ්පාදන දීමනා වැඩිදියුණු කිරීම සහ අත්දැකීම් පුද්ගලීකරණය කිරීම (personalise experiences); සහ වෙනත් ඕනෑම සාධාරණ ලෙස අදාළ වන ක්‍රියාකාරකම් සහ අරමුණු මෙයට ඇතුළත් වේ. |
| අභ්‍යන්තර කළමනාකරණය සහ පාලනය | අභ්‍යන්තර සන්නිවේදනය, වැඩසටහන් කාලසටහන්ගත කිරීම, කාලය වාර්තා කිරීම, සමාගමේ සහ සේවක වත්කම් මෙන්ම මානව සම්පත් කළමනාකරණය සහ වෙන් කිරීම, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අර්බුද කළමනාකරණය සහතික කිරීම; ව්‍යාපෘති සහ පිරිවැය කළමනාකරණය, ආයෝජක සබඳතා, සන්ධාන (alliances), ව්‍යාපාරික ව්‍යවසායන් (ventures), ඒකාබද්ධ කිරීම් (mergers), අත්පත් කර ගැනීම් (acquisitions), අත්හැරීම් (divestitures), ප්‍රතිසංවිධානය කිරීම් හෝ බැහැර කිරීම් (disposals) සහ ගැනුම්කරු සමඟ ඒකාබද්ධ කිරීම; විගණන පථ (audit trails) සහ අනෙකුත් වාර්තාකරණ මෙවලම් සම්පාදනය කිරීම, ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට අදාළ වාර්තා පවත්වාගෙන යාම, අයවැය සකස් කිරීම, මූල්‍ය කළමනාකරණය සහ වාර්තාකරණය; බුද්ධිමය දේපළ සහ ප්‍රමිතීන් කළමනාකරණය කිරීම මෙයට ඇතුළත් වේ. |
| මානව සම්පත් සහ සේවක කළමනාකරණය | සේවක බලකාය විශ්ලේෂණය කිරීම සහ සැලසුම් කිරීම; මෙයට අභ්‍යන්තර සමීක්ෂණ, කාර්ය සාධන ඇගයීම්, දක්ෂතා සහ වෘත්තීය සංවර්ධනය, පාඨමාලා සහ පුහුණු කිරීම් ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ; දුක්ගැනවිලි, විනය කරුණු සහ සේවය අවසන් කිරීම්; අභ්‍යන්තර සේවක නාමාවලිය සහ හදිසි සම්බන්ධතා පවත්වාගෙන යාම; රැකියා සහන සේවා (outplacement), රැකියා සඳහා ඇති සුදුසුකම්, මූලික බඳවා ගැනීම් හෝ නැවත බඳවා ගැනීම් කළමනාකරණය සහ පරිපාලනය; රැකියා සහතික (references) සහ පසුබිම් පරීක්ෂාවන් (background checks) ලබා දීම සහ තහවුරු කිරීම; නිවාඩු සහ අනෙකුත් නොපැමිණීම්, වේතන සහ ප්‍රතිලාභ, බදු, ණය, ප්‍රදාන, ව්‍යාපාරික වියදම් සහ ප්‍රතිපූරණය කිරීම් (reimbursements) සහ ගමන් විධිවිධාන කළමනාකරණය කිරීම මෙයට ඇතුළත් වේ. |
| සෞඛ්‍යය, රැකවරණය සහ ආරක්ෂාව | තාක්ෂණික සහ සංවිධානාත්මක ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, අභ්‍යන්තර විගණන සහ විමර්ශන පැවැත්වීම, බැදීයාවන් අතර ගැටුම් තහවුරු කර ගැනීමට තක්සේරු කිරීම් සිදු කිරීම, සේවකයින් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම; ජාල ආරක්ෂණය (network security) කළමනාකරණය කිරීම සහ දත්ත නැති වීම වැළැක්වීම; මෙහිදී උපකරණ හෝ ජාලයන්හි ඇති හානිකර දත්ත |

| | |
|---|---|
| | හඳුනා ගැනීමට සහ රහසය තොරතුරු අපගේ සීමාවන්ගෙන් බැහැර වීම හෝ එම තොරතුරු වෙත අනවසරයෙන් පිවිසීම හඳුනා ගැනීමට ස්වයංක්‍රීය තාක්ෂණයන් භාවිතා කරනු ලබයි. තවද, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, කාර්යාල උපකරණ, ආයතන (facilities) සහ අනෙකුත් දේපළවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, අපගේ කාර්ය මණ්ඩලය, රෝගීන්, අමුත්තන් සහ අපගේ ආයතන වෙත පැමිණෙන අනෙකුත් පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ රැකවරණය පවත්වාගෙන යාම සඳහාත්, වීඩියෝ හෝ වෙනත් ඩිජිටල්, ඉලෙක්ට්‍රොනික හෝ රැහැන් රහිත නිරීක්ෂණ පද්ධති හෝ උපාංග මඟින් ඔබගේ පෞද්ගලික දත්ත වාර්තා කිරීම මෙයට ඇතුළත් වේ. |
| නීතිමය සහ නියාමන බැඳීම්වලට අනුකූල වීම | බදු, වාර්තා පවත්වාගෙන යාම සහ වාර්තාකරණ බැඳීම්වලට අනුකූල වීම සඳහා නීතියෙන් හෝ අධිකරණ බලය පැවරීමකින් අවශ්‍ය වන පරිදි රජයේ ආයතන හෝ අධීක්ෂණ බලධාරීන් වෙත පෞද්ගලික දත්ත හෙළිදරව් කිරීම; වංචා හෝ දූෂණ වැළැක්වීමට හෝ හඳුනා ගැනීමට විගණන සහ විමර්ශන පැවැත්වීම; රජයේ පරීක්ෂණ සහ රජයෙන් හෝ වෙනත් පොදු බලධාරීන්ගෙන් ලැබෙන වෙනත් ඉල්ලීම්වලට අනුකූල වීම; නීතිමය ක්‍රියාවලීන්ට ප්‍රතිචාර දැක්වීම; වැරදි ක්‍රියා, ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම්, වංචා හෝ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් සේවකයින් විසින් කරනු ලබන චෝදනා වාර්තා කිරීම ඇතුළු විමර්ශන පැවැත්වීම; අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම මෙයට ඇතුළත් වේ. ආරක්ෂක හේතූන් මත සහ/හෝ අපගේ නීත්‍යානුකූල ව්‍යාපාරික අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට හෝ සැක සහිත හෝ සැබෑ නීති උල්ලංඝනය කිරීම්, රැකියා කොන්දේසි කඩකිරීම් හෝ අපගේ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම වැළැක්වීමට හෝ විමර්ශනය කිරීමට ද අප විසින් ඔබේ දත්ත භාවිතා කළ හැකි බව කරුණාවෙන් සලකන්න. |
| නීතිමය හිමිකම්වලින් ආරක්ෂා වීම | අපට මුහුණ දීමට සිදු වන නීතිමය හිමිකම් තහවුරු කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ඒවායින් ආරක්ෂා වීම; උදාහරණයක් ලෙස අධිකරණ සිතාසි හෝ නියෝග වැනි නීතිමය ක්‍රියාවලීන්ට ප්‍රතිචාර දැක්වීම, නීතිමය අයිතිවාසිකම් සහ පිළියම් (remedies) වෙනුවෙන් පෙනී සිටීම, නඩු කටයුතුවලින් ආරක්ෂා වීම සහ ඕනෑම අභ්‍යන්තර පැමිණිලි හෝ හිමිකම් (whistle-blower/ethics hotlines ඇතුළුව) කළමනාකරණය කිරීම මෙයට ඇතුළත් වේ. |
| වැඩිදියුණු කළ සේවාවන් සඳහා ආරක්ෂාවේ ගුණාත්මකබව ඉහල නැංවීම සහ තවදුරටත් සැකසීම | ආරක්ෂාවේ ගුණාත්මකබව ඉහල නැංවීමට සහ තවදුරටත් සැකසීම, ඒකාබද්ධ කිරීම, රෝගී සත්කාර ප්‍රශස්ත කිරීම සඳහා විශ්ලේෂණය කිරීම සහ සෞඛ්‍ය සේවා, නිෂ්පාදන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා (මෙයට නිර්නාමික කරන ලද දත්ත විදේශ රටවල සිටින අපගේ අනුබද්ධ ආයතන සහ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත පැවරීම ද ඇතුළත් විය හැකිය); ඔබගේ පෞද්ගලික දත්තවලින් හඳුනාගත හැකි සංරචක ඉවත් කිරීම, අපැහැදිලි කිරීම (obfuscation), නිර්නාමික කිරීම හෝ වෙනත් ඕනෑම ක්‍රමයක් මඟින් හඳුනාගත නොහැකි සහ/හෝ (de-identified and/or anonymised) දත්ත නිර්මාණය කිරීම මෙයට ඇතුළත් වේ. |

**සීලෝන් හොස්පිට්ල්ස් පීඑල්සී / ඩර්ඩන්ස් මෙඩිකල් ඇන්ඩ් සර්ජිකල් හොස්පිට්ල් (ප්‍රයිවට්) ලිමිටඩ්** අංක 03, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03. දුරකථන: +94 112 140 000